# මහසෙන් කසුප් යක් සබඳතාව

මෙරට කලා ශිල්පවල අනන්‍යතාව ඇත්තේ යක්ෂ සම්ප්‍රදායෙහි ද යන්න සොයා බැලිය යුතු කරුණකි. ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම කරවීමත් සමග අටළොස් කුළයක ජනයා මෙහි පැමිණි බව මහාවංසයෙහි සඳහන් වෙයි. ඒ පිරිස යම් කලා ශිල්ප මෙරටට හඳුන්වා දෙන්නට ඇත. එහෙත් එයට පෙර මෙරට කලා ශිල්ප නොතිබිණි යැයි කිව නොහැක්කේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ සංගීත උත්සව ගැන වංසකතාවල ම සඳහන් වන බැවිනි.

යක්ෂ ගෝත්‍රිකයන් වැව් කර්මාන්තයෙහි දක්ෂයන් වූ බව ද පඬුඅබා කුමරු රජවීමට පෙර ද මෙරට වැව් තිබූ බව ද අපි දනිමු. දක්ෂ ගොවියන් ද වූ යක්ෂ ගෝත්‍රිකයන් මෙරට දී වැව් නිර්මාණය කරන්නට ඇතැයි අපට නිගමනය කිරීමට හැකි වන්නේ යක්ෂ ගෝත්‍රියන් විසූ වෙනත් රටවල අපට පෙර වැව් තනා නොමැති බැවිනි. යක්ෂ ගෝත්‍රිකයන් කතා කළ භාෂාව ගැන අද අපට වැඩි විස්තරයක් දැනගත නො හැකි ය.

අද සිංහල භාෂාවේ මාතෘ භාෂා ලෙස පාළි හා සංස්කෘත භාෂා පිළිගැනෙයි. මේ අර්ධ වෛදික සංස්කෘතියෙහි බලපෑම නිසා සිදු වී ඇත්තකි. අද අප සිංහල භාෂාව ලෙස හඳුන්වන භාෂාව අර්ධ වෛදිකයන්ගේ මාගධී ප්‍රාකෘතයෙහි හෝ ආසන්න ප්‍රාකෘතයක හා පසුව සංස්කෘත භාෂාව ලෙස හඳුන්වන භාෂාවෙහි බලපෑම මත සකස් වී ඇති බව පැහැදිලි ය. මාගධී ප්‍රාකෘතයෙන් හෝ එයට ආසන්න ප්‍රාකෘතයකින් පොත් ලිවීමෙන් පසුව ඒ භාෂාවට පෙළ බස හෙවත් පාළි යැයි ව්‍යවහාර වී ඇති බව පෙනී යයි.

අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීමට පෙර මෙරට විසූ විවිධ ගෝත්‍රවල ජනයා හෙළ බස නමින් බසක් කතා කෙළේ යැයි අපවත් වී වදාළ බද්දේගම විමලවංශ නාහිමියන් පවසා ඇත. අර්ධ වෛදිකයන් මෙරට ස්ථාවර වීමෙන් පසුව ඔවුන්ගේ බස ටිකෙන් ටික මෙරට පැතිරෙන්නට ඇත. ඒ සමග යක්ෂ ගෝත්‍රිකයන්ගේ බස ක්‍රමයෙන් අභාවයට යන්නට ඇත. එහෙත් ඒ බසෙහි ඇතැම් වචන අපි අදත් යොදා ගනිමු. ඒ සඳහා හොඳ ම උදාහරණය අප ශරීරයේ අවයව වලට කියන නම් බොහොමයක් තවමත් යක්ෂ ගෝත්‍රිකයන්ගේ බසෙහි වචන වීම ය.

කට බඩ කකුල බෙල්ල ආදී වචන යක්ෂ ගෝත්‍රික භාෂාවේ ඒ සඳහා යෙදෙන නම් ය. මේ සියල්ල සඳහා මුව උදරය පාදය ගෙල ආදී පාළි වචන තිබිණ ද ලියන බසෙහි ඒ පාළි වදන් යෙදුණ ද කතාකරන බසෙහි බොහෝ විට යෙදෙන්නේ යක්ෂ ගෝත්‍රිකයන් යොදා ගත් වචන ය. කමතෙහි දී යොදා ගන්නා වචන සාමාන්‍ය ජීවිතයෙහි ඒ ඒ කරුණු සඳහා යොදාගන්නා වචනවලට වඩා වෙනස් ය. ඒ එසේ වී ඇත්තේ ඇයි?

තම භාෂාව ක්‍රමයෙන් අභාවයට යනු දුටු යක්ෂ ගෝත්‍රික නායකයන් කමතෙහි දී සිරිතකට මෙන් යක්ෂ ගෝත්‍රිකයන්ගේ වචන යොදාගැනීමට නියම කරන්නට ඇත් ද? සිරිතක් ලෙස නියම කිරීමෙන් පසු ඒ කැඩීම එතරම් පහසු නො වේ. සිරිත් යනු එකල නීතිය මෙන් විය. රාජසභාවේ සිටි පැරණි සිරිත් ලේනා වත්මන් නීතිපතිවරයාට සමාන නිලයක් හොබවන්නට ඇත.

එහෙත් මේ පිළිබඳ අපට සියයට සියයක් ම සහතික වීමට නො හැකි ය. මේ සම්බන්ධයෙන් හැදැරිය යුතු දෑ බොහෝ ය. විෂ්ණු පුරාණය, ස්කන්ධ පුරාණය ආදී පුරාණ ග්‍රන්ථවල කියැවෙන කරුණු අපට අදාළ වන්නේ ද? එසේ නම් ඒ කිනම් අවස්ථා සම්බන්ධයෙන් ද? විෂ්ණු ලංකාවට පැමිණ මෙරට වාසය කළ අයිරාන සහ තවත් රජ කෙනකු පරාජය කළ බව කියැවෙයි. මේ අයිරාන රජු යක්ෂ ගෝත්‍රිකයෙක් වී ද? ස්කන්ධ කුමරු අතින් පරාජයට පත්විණි යැයි කියන තාරක රජු මෙරට රජකළ යක්ෂ ගෝත්‍රික රජෙක් ද?

හෙළ හවුලේ මේ සම්බන්ධ ඇතැම් අදහස් තිබේ. ඒ අදහස් හුදෙක් වචනවල නිරුක්තිය මත පමණක් පදනම් නොවී වෙනත් කරුණු මත පදනම් වී තහවුරු කරගත හැකි ද? මෙරට පැරණි නාමය ලංකාව විය. දීපවංසය අප රට හඳුන්වන්නේ ලංකාව ලෙස ය. එහෙත් මහාවංසයෙහි ලංකාව සිංහල ද්වීපය වී ඇත. සිංහලය යන්න සිංහ ගෝත්‍රයෙහි ප්‍රධානත්වය දනවන වචනයකි. සිංහල යන්න සිංහ යන්නට ගෞරවාර්ථයෙන් ල ප්‍රත්‍යය එකතුවීමෙන් නිර්මාණය කරගන්නට ඇතැයි සිතේ.

© Prof. Nalin De Silva

පඬුඅබා රජු දවස සිංහල ජාතිය නිර්මාණය වීම ඇරඹිණි ද එය බොහෝ දුරකට සාර්ථකත්වයක් ලබා ඇත්තේ වංසකතා ලිවීම ආරම්භ වූ කාලයෙහි දී යැයි සිතිය හැකි ය. අනෙක් අතට වංසකතා ලිවීමේ එක් අරමුණක් වූයේ (එය ප්‍රධාන අරමුණ නොවී නම්) සිංහල ජාතිය තහවුරු කිරීම විය හැකි ය. යක්ෂ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයනට විරුද්ධව තම අවසාන සටන කර ඇත්තේ ද මෙකල බව පෙනී යයි.

යක්ෂ ගෝත්‍රිකයන් ටික දෙනකු හැරෙන්නට අනෙක් අය පඬුඅබාගේ සිංහල ජාතියට එකතුවීම ප්‍රතික්ෂෙප කළ ද නාගයන් සිංහල ජාතියට එකතු වී ඇත. මහින්දාගමනයෙන් පසු අර්ධ වෛදිකයන් අතර බුදුදහම පැතිර යත් ම බුදුදහමට ඉතා ලැදි වූ නාග දේව ගෝත්‍රිකයන් සිංහල ජාතියත් සමග වඩ වඩාත් මිශ්‍ර වී ඇති බව පෙනෙයි. අර්ධ වෛදිකයන් හා නාග දේව ගෝත්‍රිකයන් අතර ආවාහ විවාහ සම්බන්ධකම් ද ඇති වී නාග ගෝත්‍රිකයන් රජ පවුල්වලට ද සම්බන්ධ වී ඇත.

ඒ සම්බන්ධකම් ඔස්සේ බල්ලාටනාග, චෝරනාග, ඉළනාග, චූලනාග, සිරිනාග, අභයනාග ආදී රජවරු රජකර ඇත. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් එලෙස නිල වශයෙන් කිසිදු ඇදක් කුදක් නැතිව රජකමට පත්වූ බවක් නො පෙනෙයි. ඇතැම් රජකු යක්ෂ ගෝත්‍රික කාන්තාවක සමග සම්බන්ධකම් ඇතිකර ගත්ත ද ඒ සම්බන්ධයෙන් උපන් කුමාරවරුන්ට හිමි වී ඇත්තේ දෙවැනි පංතියේ වැදගත්කමක් යැයි කිව හැකි ය. සාලිය කුමරු ද ඇතැම් ජනප්‍රවාදයකට අනුව කොත්මලේ ප්‍රදේශයේ යක්ෂ ගෝත්‍රික කාන්තාවක් සමග ගැමුණු කුමරු ඇතිකරගත් සම්බන්ධයකින් උපන් කුමරෙකි.

ඉතිහාසයෙහි සාලිය කුමරු ගැන කියැවෙතත් ඔහුගේ මැණියන් ගැන කිසිවක් සඳහන් නො වෙයි. ගැමුණු කුමරුට පසුව සාලිය කුමරුට රජකම අහිමි වූයේ එක් මතයකට අනුව එකල රජකම පියාගෙන් පුතාට නොව සොහොයුරාගෙන් සොහොයුරාට හිමි වූ නිසා ය. එහෙත් සාලිය කුමරු යක්ෂ ගෝත්‍රික කාන්තාවක කුසින් බිහි වූ නිසා රජකම අහිමි වී ය යන්න ද බැහැර කළ නො හැකි ය. නාගයන් මෙන් නොව යක්ෂයන් බුදුදහමට එතරම් සමීප නොවීම ද පසුකාලීන ව ඔවුන් සිංහල ජාතියට එකතු වීමේ දී ප්‍රශ්න ඇතිකරන්නට ඇත.

ඉළනාග රජු සමයේ දී (බු ව 580 -586) පමණ සිට ලම්බකර්ණ වාංශිකයන්ගේ බලවත් වීමක් දැකිය හැකි ය. ඔවුන් කවුරුන්දැයි හරිහැටි කිව නොහැකි නමුත් යක්ෂ ගෝත්‍රිකයන් ඔවුන්ට සහාය දී ඇති බවක් පෙනෙයි. ක්‍රමයෙන් බලවත් වූ ලම්බකර්ණ වාංශිකයන් යසලාලක තිස්ස රජුගෙන් පසුව රාජ්‍යත්වය ලබාගෙන ඇත. ශුභ රජු (බු ව 602) පළමු ලම්බකර්ණ වාංශික රජු ලෙස සැලකිය හැකි ය. මේ සිද්ධිය හුදු දොරටුපාලයකු විහිළුවක් වැරදීමකින් රජකමට පත්වූ අවස්ථාවක් නොව අලුත් වංශයක් සිංහලේ රජකමට පත් වූ අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය.

ශුභ රජුගෙන් පසු වසභ ආදීන් පමණක් නොව සංඝතිස්ස සංඝබෝධි ගෝඨාභය ආදී ලම්බකර්ණ වාංශික කුමාරවරුන් රජකමට පත් වී ඇත. මෙරට ඉතිහාසයේ පව් මෙන් ම පින් ද කල තැනැත්තා ලෙස වංසකතාවෙහි කියැවෙන මහාසේන රජු (බු ව 819 - 847) ගෝඨාභය රජුගේ පුතෙකි. ජනප්‍රවාදයට අනුව යක්ෂ ගෝත්‍රික කතකගේ පුතෙකි. මහාසේන රජු මහාවිහාරය සමතලා කර එහි උඳු වැපිරවී ය. සංඝමිත්‍ර නම් භාරතයෙන් පැමිණි භික්ෂුවකගේ උපදෙස් එහී දී රජුට බල පෑවේ ය. පසුව මහසෙන් රජු වරද පිළිගෙන මහාවිහාරය යථා තත්වයට පැමිණ වී යැයි කියැවෙයි.

මෞර්ය වාංශිකයකු ලෙස හැඳින්වෙන ධාතුසේන රජු බු ව 1004 දී රජවිය. ඒ ක්‍රිස්තු වර්ෂයෙන් 461 දී ය. එනම් පස්වැනි සියවසේ දී ය. කාශ්‍යප රජු ධාතුසේන රජුගේ හා යක්ෂ ගෝත්‍රික කාන්තාවකගේ පුතකු යැයි කියැවෙයි. කසුප් රජුට යක් සබඳකම් තිබීම හේතුවෙන් ඔහුට ඒ සංස්කෘතික උරුමය ද හිමි වී ඇත. යක්ෂ ගෝත්‍රිකයන් එකල බලවත් වී ඇති බව පැහැදිලි ය. මෙරට ඉතිහාසයේ පළමු වතාවට අර්ධ වෛදික රජකුට භරාතයට පැන යෑමට සිදු වී ඇත. මුගලන් රජු සේනා සංවිධානය කිරීමට භාරතයට පැන ගියේ ය.

මහාවිහාරය මහසෙන්ට මෙන් ම කසුප්ට ද විරුද්ධ විය. එහි වරදක් ඇතැයි කිව නො හැකි ය. යක්ෂ ගෝත්‍රික සම්බන්ධකම් ඇති රජවරු දෙස මහාවිහාරය වපරැසින් බැලී නම් එහි පුදුම වීමට කරුණක් නැත. බුද්ධඝෝෂ හිමියන් මෙරටට වැඩම කර ඇත්තේ මහානාම රජුගේ කාලයෙහි ය. ඒ බු ව 955 හා 977 අතර ය. මහාවිහාරය භාරතයේ ථෙරවාදය අතුරුදහන්වන ආකාරය බලා ආනන්ද භික්ෂූන් වහන්සේ සමග ථෙරවාදය ආරක්ෂා කිරීමේ මාවතකට එළඹී ඇත්තේ මෙකල ය. බුදුදහම පාළියෙන් ලිවීම, සිංහල බුද්ධාගම නිර්මාණය කිරීම, බලවත් වූ

© Prof. Nalin De Silva

යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය දුර්වල කිරීම ආදී සියල්ල වසර සියයක හමාරක පමණ කාලයක සිදු වී ඇත. මුගලන් රජු බු ව 1040 දී රජ විය. ඔහුට මුල දී භික්ෂූන් වහන්සේ ආධාර කළහ. එහෙත් ඔහුගේ රකුසු පිළිවෙත් හේතුවෙන් ඔහු අප්‍රසාදයට පත්විය.

ඉන් පසු යුගයේ දී යක්ෂ ගෝත්‍රිකයන්ට සිංහල ජාතිය සමග එක්වීම හැර වෙනත් විකල්පයක් නැතිවිය. ක්‍රිස්තු වර්ෂයෙන් විසිවැනි සියවස වන තෙක් ම යම් අනන්‍යතාවක් රැක ගැනීමට යක්ෂ ගෝත්‍රිකයන් සමත් වී ඇති නමුත් අද ඔවුන් සදංහල ජාතිය සමග බද්ධ වී ඇත. යක්ෂ ඉතිහාසය පිළිබඳ අප නොදන්නා කරුණු බොහෝ ය. කෙහොඹා කංකාරිය, අපේ බෙර ආදිය පිළිබඳ සෑහීමකට පත්විය හැකි අධ්‍යයනයක් කෙරී නැත. කොහොඹා කංකාරියෙන් ඇත්තට ම කියැවෙන්නේ කුමක් ද? සිංහල කටහඬේ උරුමය යක්ෂ ගෝත්‍රියන්ගෙන් ලැබුණක් ද? සිංහල සංගීතය කෙතරම් දුරට යක්ෂ සංස්කෘතියත් සමග සම්බන්ධ වේ ද? අප යක් බෙරය යනුවෙන් හඳුන්වන බෙරය කුමක් ද? අපේ නැටුම්වල ඉතිහාසය කුමක් ද? මේ නැටුම් භාරතයේ නැත්තේ ඇයි? අපේ සංගීතයක් ලෙස ලෝකයට ඉදිරිපත් කළ හැක්කේ බෙර වාදනය හා නැටුම් නො වේ ද? එහි උරුමය යක්ෂ ගෝත්‍රිකයන් සතු වේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva